www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද ධාවනයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය දුප්පත් පවුල් පදිංචි ස්ථානවලින් ඉවත් කරයි

## Sri Lankan defence ministry evicts poor families as part of war drive

**අපේ වාර්තාකරුවන් විසිනි**
**2008 ජුලි 31**

ආරක්ෂක අමාත්‍යංශයට ඉඩම හිමි බව ප්‍රකාශ කරමින් මධ්‍යම කොලඹ පවුල් 800 වැඩි ගනනක් ඔවුන් පදිංචි ස්ථානවලින් ඉවත් කිරීමට ආන්ඩුව නියෝග නිකුත් කර තිබේ.

සිය නිවාස බුල්ඩෝසර් කිරීමට විරුද්ධව කෝපාවිෂ්ට වූ වැසියෝ කැරලි මර්දන පොලීසිය සමග ගැටුනාහ. උසාවිය මැදිහත් වීමක් ඔවුන් ඉල්ලා සිටි අතර ජුලි 30 දක්වා නිවාස කැඩීම නතර කරන ලෙස උසාවිය තහනම් නියෝගයක් නිකුත් කලේ ය. කෙසේ නමුත් දැනටමත් නිවාස 45ක් කඩා දමා තිබේ. ඒවායේ පදිංචිව සිටි සිය ගනනක් ජනයා හදිසියේ ඉදිකල පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් 5ක් පමන දුරින් පිහිටි තාවකාලික ලෑලි මඩුවලට යවා ඇත.

කොම්පඤ්ඤ වීදියේ ග්ලෙනී පැසේජ් ප්‍රදේශයේ දහස් ගනනක් ජනයා ජීවත් වෙති. ඔවුන් " යුද දෙපාර්තමේන්තුව" ලෙස මූලික පිඹුරුපත්වල සඳහන් අමාත්‍යංශයට අයිති ඉඩමෙහි අනවසරයෙන් පදිංචිව සිටින බව ප්‍රකාශ කරමින් ජුලි 10 වෙනිදා එක් එක් පවුල වෙත ලිපියක් නිකුත් කලේ ය.

ලියුමෙහි මෙසේ සඳහන් විය: "රාජ්‍ය දේපලවල අනවසරයෙන් පදිංචිව සිටීම නීති විරෝධී වන අතර වර්තමාන ආරක්ෂක තත්වය සැලකිල්ලට ගෙන දින 7ක් ඇතුලත ඔබ ඉවත් විය යුතු ය. ආරක්ෂක ඇමතිවරයා ද වන ජනාධිපති මහින්ද රාජපක්ෂගේ සොහොයුරු ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ වෙනුවට එය අත්සන් කර තිබුනි.

බලයට පත් ආන්ඩුව විසින් 1977 සිට වරින් වර මෙම නිවැසියන් ඉවත් කිරීමට උත්සාහ කර තිබේ. නමුත් ආරක්ෂක අමාත්‍යංශය මැදිහත් වූ පලමු වතාව මෙයයි. පදිංචි ස්ථානවලින් ඉවත් කිරීමේ මෙහෙයුම දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහිව උතුරු නැගෙනහිර ගෙන යන යුද්ධය ජීවන කොන්දේසි සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට පහර දීමට යොදා ගන්නා බවට තවත් උදාහරනයකි.

ග්ලෙනී පැසේජයේ එක් පසෙකින් ගුවන් හමුදා මූලස්ථානය පිහිටා ඇති අතර අනෙක් පසින් කුඩා ඇලමාර්ගයකින් වෙන් වූ හමුදා මූලස්ථානය පිහිටා තිබේ. යුද යාන්ත්‍රනය දිරි ගැන්වීමේ කොටසක් ලෙස රාජපක්ෂ ආන්ඩුව මිලිටරි සංකීර්නයන් ගොඩනැගීම සඳහා අගනුවර බොහෝ ප්‍රදේශ අත්පත් කර ගනිමින් සිටිති.

මෙම සතියේ පැවැත්වෙන කලාපීය සහයෝගිතාවය පිලිබඳ දකුනු ආසියානු සංගමයේ (සාර්ක්) සමුලුව සමග පදිංචි ස්ථානවලින් ජනයා ඉවත්කිරීම සමපාතවෙයි. මුඩුක්කු නිවාස සහ කුඩා කඩසාප්පු ඇතුලු "අනවසර" ඉදිකිරීම් ඉවත්කර නගරය "අලංකාර කරමින්" තිබේ.

මෙම ජනයා මෙම ප්‍රදේශයේ දශක 5ක පමන සිට පදිංචිව සිටිති. බොහෝ අය යතුරු කපන්නන්, සපත්තු පිලිසකර කරන්නන්, පදික වෙලඳුන් සහ ත්‍රී වීල් රියදුරන් ඇතුලු දෛනික කම්කරුවෝ සහ ස්වයං රැකියාවල නිරතව සිටින්නෝ ය. බොහෝමයක් ඒවා ලෑලි මඩු වන අතර සමහර නිවාස සාපේක්ෂව හොඳින් ගොඩනගා ඇත.

පදිංචිකරුවන්ට නීත්‍යානුකූල ලියවිල්ලක් දී නැතත් ඔවුන්ට විදුලිය සහ ජලය සැපයීම, වරිපනම් ගෙවීම සහ ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම කර තිබෙන්නේ මෙම ලිපිනයන්ට ය. ලමයි යාබද පාසල්වල ඉගෙන ගනිති. එම නිසා ඔවුන්ගේ නිවාස "අනවසර" ඒවා වෙන්නේ කෙසේදැයි නිවැසියෝ ප්‍රශ්න කරති.

*ලෝක සමාජවාදී වෙබ් අඩවියට* අදහස් ප්‍රකාශ කල ග්ලෙනි පැසේජ් පල්ලියේ ප්‍රධානියා වන ටී.එන්.පී. ෆාරිස් මෙහි පදිංචිව සිටින අය අනවසර පදිංචිකරුවන් යැයි ආන්ඩුව විසින් කරනු ලබන චෝදනාව ප්‍රතික්ෂේප කලේ ය. "සමහර මිනිස්සු මෙහි වසර 60ට වැඩි කාලයක් පදිංචිව සිටිනවා. මෙහි ආරම්භක පදිංචිකරුවන් දෙවන ලෝක යුද්ධ කාලයේදී සිංගප්පූරුවෙන් මෙහෙට ගෙන ආ අය. දැන් මෙහි සිංහල, දෙමල, සහ මුස්ලිම් අය ඉන්නවා. ඔවුන් සාමයෙන් සහ සමගියෙන් ජීවත් වෙනවා."

ලිපිය නිකුත් කර දින හතකට පසුව ජුලි 18 මැනවින් සන්නද්ධ වූ කැරලි මර්දන පොලීසිය සමග පැමිනි නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීහු මිනිසුන්ට ඔවුන්ගේ බඩු බාහිරාදිය පවා ඉවත් කර ගැනීමට කාලයක් නොදී නිවාස බුල්ඩෝසර් කිරීම ආරම්භ කලහ. පොලීසිය සමග ගැටුනු දහස් ගනනක්

පදිංචිකරුවෝ ප්‍රදේශය හරහා දිවෙන කොලඹ-මාතර දුම්රිය මාර්ගය අවහිර කලහ. විරෝධතාවයෙහි යෙදෙන පදිංචිකරුවන් විසුරුවා හැරීම සඳහා පොලීසිය ඔවුන්ට කඳුලු ගෑස් ප්‍රහාර එල්ල කලේ ය.

තමන් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් යයි හඳුන්වා ගත් මැර කන්ඩායමක් ජනමාධ්‍ය විසින් සිද්ධිය ආවරනය කිරීම වැලැක්වීමට උත්සාහ කලේ ය. ඩේලි මිරර් පත්‍රයේ මාධ්‍යවේදියකු වන රොහාන් පෙරේරාට සහ කැමරාකරුවෙකුට ඔවුහු පහර දුන්හ. ප්‍රහාරකයන් ආරක්ෂක අංශවල සාමාජිකයන් බව ප්‍රදේශවාසීහු ප්‍රකාශ කලහ.

උපරිමාධිකරනය උසාවි නියෝගයක් නිකුත් කරන විට නිවාස දුසිම් ගනනක් කඩා දමා තිබුනි. උසාවිය නියෝගය නිකුත් කිරීමෙන් පසුව ද නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිවාස කැඩීම දිගට ම කර ගෙන ගියේ ය. කඩා දැමූ මුලු නිවාස සංඛ්‍යාව 45කි.

සමහර නිවාසවල තිබූ නිවැසියන්ගේ රෙදි, පාසල් නිල ඇඳුම්, මුලුතැන්ගෙයි උපකරන, ටීවී, රේඩියෝ වැනි විදුලි උපකරන සුන්බුන් අතර වැලලී ගියේ ය. උසාවියේ අවසන් තීන්දුව දෙන තුරු නිවාස කැඩීම යලි ආරම්භ නොකරන බවට නීතිපති පසුව පොරොන්දු විය. කෙසේ නමුත් විරෝධතා වැලැක්වීමට සහ පදිංචිකරුවන්ට ඉවත් වීමට බලපෑම් කිරීම සඳහා ඔවුන්ව බියගැන්වීමේ ක්‍රියාවලියක් සිදු වෙමින් තිබේ.

සන්නද්ධ පොලීසිය සහ ආරක්ෂක බලකායන් ප්‍රදේශය තුල යොදවා ඇත. නාගරික මන්ත්‍රීවරයෙකු වූ ඒ.සී.එම්. නදුර්දීන්ගේ නිවසට ජුලි 22 සවස සුදු වෑන් රථයකින් පැමිනි තමන් දෙමටගොඩ පොලීසියෙනැයි හඳුන්වාගත් සිවිල් ඇඳුම් ඇඳගත් පිරිසක් තමන් සමග පොලීසියට යාමට එන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේ ය. එම කන්ඩායම තමන්ව පැහැරගෙන යාමට උත්සාහ කරන බවට සැක කල නදුර්දීන් ඔවුන් සමග යාම ප්‍රතික්ෂේප කලේ ය. නදුර්දීන් ඊට පෙර බලහත්කාරයෙන් එහි පදිංචි පුද්ගලයන් ඉවත් කිරීමට විරුද්ධව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට පෙත්සමක් බාරදී තිබුනි.

ආරක්ෂක බලකායන්ට සහ ඒවා සමග සම්බන්ධ අර්ධ මිලිටරි රහසිගත කන්ඩායම් විසින් ආන්ඩුව සහ යුද්ධය විවේචනය කරන මිනිසුන් සිය ගනනක් පැහැර ගැනීම, ඝාතනය කිරීම සහ අතුරුදහන් කරනු ලැබ ඇත. මෙම ඝාතක කල්ලි නීතිමය දඬුවම් ලැබීමකින් තොරව ක්‍රියාත්මක වන අතර ඔවුන්ට කොලඹ හා යාබදව පිහිටුවා ඇති අසංඛ්‍යේය පොලිස් සහ මිලිටරි පරීක්ෂන කපොලු අතරින් නිදහසේ යාමට ඉඩ සලසා තිබේ.

ඉවත්කල පවුල් 45 උතුරු කොලඹ තොටලඟ වැලිගොඩ වත්තට ගෙන ගොස් දමා ඇත. එක් පවුලකට ලබා දී ඇත්තේ තවමත් ඉදිකිරීම් අවසන් කර නැති වර්ග මීටර් 15 මඩුවකි. වැසිවලින් නිසි ආවරනයක් නොලැබෙන ආකාරයට අල්ප වශයෙන් වහලවල් සෙවිලි කර ඇති මෙම මඩුවල විදුලි රැහැන් ස්ථානගත කිරීම නිසි ප්‍රමිතියට අනුව සිදු කර නැත. ප්‍රමානවත් තරම් වැසිකිලි පහසුකම් නැති අතර ඔවුන් සියලු දෙනාටම ඇත්තේ එක් පොදු ජල කරාමයකි. එක් මඩුවකට ලබා දී තිබෙන්නේ එක් විදුලි බල්බයක් පමනි. වසරක් තුල ස්ථිර නිවාස තනා දීමට සහ පවුල් විසින් නිවසක් කුලියට ගන්නේ නම් මාසයකට රුපියල් 8,000 කුලියක් ගෙවීමට ආන්ඩුව පොරොන්දු වී තිබේ.

එහෙත් තමන් මෙම පොරොන්දු විශ්වාස නොකරන බව නිවැසියෝ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසූහ. හතලිස් හය හැවිරිදි මවක් පැවසුවේ: "අවුරුදු තුනකට කලින් ඔවුන් මේ පොරොන්දුව ම අපට දුන්නා. අපට මහල් නිවාස හදලා දෙනවා කියලා දෙමටගොඩ දුම්රිය අංගනයේ අවුරුදු දෙකකට කලින් මුල් ගලක් තිබ්බා නමුත් කිසි දෙයක් වුනේ නැහැ.

"නිසි පහසුකම් නැතිව කුඩා කාලේ ඉඳලා අවුරුදු 30 අප මෙතන ඉන්නවා. අපට පාවිච්චි කරන්න වෙලා තියෙන්නේ පොදු වැසිකිලි. මට දරුවො පස්දෙනෙක් ඉන්නවා. මගෙ මහත්තයයි පුතාලා දෙන්නෙකුයි මැද පෙරදිග වැඩ කරනවා. අප ජීවත්වෙන්නේ ඒගොල්ලො උපයන මුදල්වලින් මගේ ලොකු පුතා විවාහ වෙලා. ජීවන වියදම හුඟක් වැඩියි. ජීවත් වීම හරිම අමාරුයි.

"දැනට අපේ ගෙදර හය දෙනෙක් ඉන්නවා. මගේ නැන්දම්මයි එයාගෙ සහෝදරයයි ඉන්නේ අපිත් එක්ක. ඒගොල්ලන්ට ගෙයක් නැහැ. මගෙ එක දුවක් ආබාධිතයි. එයාට අපි විශේෂ වැසිකිලියක් හදලා තියෙනවා. මේ තත්වය තුල අප කොහොමද පුංචි මඩුවක ජීවත් වෙන්නේ?"

තිස්අට හැවිරිදි කම්හල් කම්කරුවෙකු මෙසේ පැවසුවේය: "හැම ඡන්දෙකදීම දේශපාලනඥයෝ ඇවිල්ලා බොරු පොරොන්දු දෙනවා. නමුත් අපේ ජීවිත වඩාත් නරක තත්වෙට ඇදවැටිලා. මේ පොරොන්දු ගැන මට කිසිම විශ්වාසයක් නැහැ. 2004 දෙසැම්බරයේ සුනාමියට අහුවුන අයට මොකද වෙලා තියෙන්නේ. අවුරුදු හතරකට පස්සෙත් දහස් ගනනක් තවමත් ඉන්නේ තාවකාලික කූඩාරම්වල."

ඉහල යන බඩු මිල ගැන ද ඔහු සඳහන් කලේ ය: "මගේ දවසේ ආදායම රු. 450යි. මගේ බිරිඳට රක්ෂාවක් නැහැ. නමුත් කලින් ඒ මුදලින් අපට වියදම පිරිමහගන්න පුලුවන් උනා. මට ළමයි දෙන්නෙක් ඉන්නවා. බිරිඳට තවත් ළමයෙක් ලැබෙන්න ඉන්නේ. දැන් මගේ දවසේ ආදායම ප්‍රමානවත් නැහැ. දැන් අපට එක වේලකට රුපියල් 450 අවශ්‍යයයි.

"මේ තත්වය දිගටම තිබුනහොත් රටේ ආහාර කැරලි ඇතිවෙයි. බඩුමිල වැඩි කිරීම මගින් ආන්ඩුව

යුද්ධයේ බර මහජනයා මත පටවලා තියෙනවා. අපට යුද්ධය අවශ්‍ය නැහැ. සියයට අනූවක් ම යුද්ධෙට විරුද්ධයි."

ප්‍රදේශයේ සිසුහු සෙන්ට් මයිකල් සෙන්ට් මේරි සහ අල් අමීන් වැනි අසල්වැසි පාසල්වලට ගියහ. දැන් තොටලඟ පදිංචිව සිටින 14වියැති පාසල් ශිෂ්‍යයාවක් මෙසේ පැවසීයඃ "මගේ මල්ලිලා තුන්දෙනයි මායි සිකුරාදා ඉඳලා පාසල් ගියේ නැහැ. ඔවුන් අපේ නිවස බුල්ඩෝසර් කරන කොට අපේ පාසල් නිල ඇඳුම්, සහ පෙලපොත් අපට අහිමි වුනා. මා ඉගෙනගන්නෙ දහය වසරෙ. මේ දවස්වල දෙවැනි වාර විභාගය. නමුත් මට වාර විභාගයට පෙනී ඉන්න බැහැ. මෙහෙ අපට ඉගෙනගන්න පහසුකම් නැහැ. ඊලඟ අවුරුද්දෙ මට සාමාන්‍යපෙල විභාගයට ලියන්න තියෙනවා."

ඇගේ දෙමාපියන් සමග තොටලඟ තාවකාලික නිවසක පදිංචිව සිටින වසරක අතදරුවෙකු සිටිනා 26 වියැති තරුන මවක් ඇගෙ නිවස බුල්ඩෝසර් කරන විට ඇයට තිබුන හැම දෙයක් ම අහිමි වූ බව පැවසී යඃ "මා උසස්පෙල දක්වා ඉගෙනගත්තා. මගේ වයසේ අනික් බොහෝමයක් ලමයි වගේම මාත් පාඩම් කලේ කුප්පි ලාම්පුවක ආධාරයෙන්. ඉස්කෝලයෙන් අස්වුනාට පස්සේ රක්ෂාවක් හොයාගන්න බැරිවුන නිසා මා සෞදි අරාබියට ගියා. අවුරුදු තුනක් එහෙ හිටියා. ඒ සල්ලිවලින් තමයි අපේ ගේ හැදුවේ. දැන් මගේ මහත්තයා සෞදිවල රක්ෂාවක් කරනවා.

"අපේ දරුවගෙ අනාගතය හොඳවෙයි කියලා අප හිතුවා. නමුත් දැන් අපේ බලාපොරොත්තු ඔක්කොම බිඳවැටිලා. මේ දූවිලි ගොඩේ මගේ දරුවවගේ ලදරුවන්ට ඉන්න බැහැ. අප මෙහාට ආවේ සිකුරාදා. දැනටමත් ලමයි කීප දෙනෙක් ලෙඩ වෙලා. රෑට නිදාගන්න දරුවත් එක්ක මා මගේ මාමාගේ ගෙදරට යනවා.

"ආන්ඩුව පත් කරන්නේ ජනතාවඃ ඒනිසා ඔවුන් ජනතාවට වගකිව යුතුයි. කිසිම දේශපාලනඥයෙක් අප ගැන සැලකීමක් නැහැ. ඊලඟ මැතිවරනයේදී කාටවත් ඡන්දෙ දෙන්නෙ නැහැ."

© www.wsws.org